කුච්චවේලි ප්‍රාදේශීය සභාව - 2023
---------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කුච්චවේලි ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කුච්චවේලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ නිම කරන ලද ප්‍රතිසංස්කරණ කටයුතු 04ක් සඳහා රුපියල් 2,657,096ක මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට අදාළ කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු මුදල මූල්‍ය ප්‍රකාශනයේ දැක්විමට පියවර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් රු. 1,757,037 ක් වටිනා මහන මැෂින් 68 ක්, විදුලි කේතල 150 ක් සහ ජල ටැංකි 18 ක් ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට අදාළ කටයුතු කරනු ලැබේ. | මෙහෙයුම් වියදම් ආදායම් වියදම් ගිණුමේ දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අඩු කරන ලද මස් කඩ බදු මූලික තැන්පතු රු. 1,290,327ක් මූල්‍ය ප්‍රකාශනවල් බදු හිඟ මුදල් වලින් අඩු දක්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට අදාළ කටයුතු කරනු ලැබේ. | බදු හිඟ මුදලින් අඩුකර දැක්වීමට කටයුතු කළ යුතුයි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ රු. 863,106 ක වියදමින් ඉදිකරන ලද මාතෘ ළමා සුරැකුම් මධ්‍යස්ථානයේ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට අදාළ කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනයේ අදාළ මුදල දැක්වීමට පියවර ගත යුතුයි. |

### 1.6.2 විගණනයට ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු. 217,210,559 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛන සුදුසු සාත්ෂිද ඉදිරිපත් කරනු ලැබේ. | ලියවිලි ලබා ගැනීම සඳහා සුදුසු පියවර ගත යුතුය |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ------------------ | -------------------- | -------------------------- | ------------------ |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 149 වගන්තිය | සභාව විසින් අනුමත කරන ලද සංචාරක නිකේතන 10 කින් ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සංචාරක නිකේතනය සඳහා ගාස්තුවක් අයකරනු ලැබේ.හිඟ පවතින සංචාරක නිකේතන වෙත ලිඛිත දැනුම්දීමක් නිකුත් කර ඇත. | හිඟ අයකර ගැනීමට පියවර ගත යුතුයි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | 571(1),(2), (3) | වර්ෂ 02 කට වැඩි කල් ඉකුත් වූ රු.31,849,992 ක තැන්පතු 36 ක් සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ගැලපීම් කිරිමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචන

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 27,318,991 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 34,206,395ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ

| | ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 15,615,360 | 38,540,360 | 15,334,449 | 23,206,000 | 22,224,000 | 32,791,000 | 9,866,000 | 22,925,000 |
| (ii) | කුලී | 6,575,400 | 20,490,400 | 2,609,370 | 17,881,030 | 8,382,000 | 16,571,000 | 2,656,000 | 13,915,000 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,085,200 | 2,896,593 | 2,896,592 | - | 5,975,000 | 1,987,000 | 1,987,000 | - |
| (iv) | වෙනත් ආදායම් | 1,762,200 | 1,347,328 | 1,347,328 | - | 1,943,000 | 4,304,000 | 4,304,000 | - |
| | එකතුව | 26,038,160 | 63,274,681 | 22,187,739 | 41,087,030 | 38,524,000 | 55,653,000 | 18,813,000 | 36,840,000 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ සියලුම ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | **සමාලෝචිත වෂර්ය අවසානයේ හිඟ වරිපනම් බදු රු. 23,206,000 ක් විය. එය එම වසරේ බිල්කළ රු. 38,540,360 ට සාපේක්ෂව සියයට 60 කට වැඩි අගයක් ගෙන තිබුණි.** | **මේ සම්බන්ධයෙන් කඩිනම් පියවර ගනු ලැබේ.** | **හිඟ මුදල් අයකිරීමට කටයුතු කළ යුතුයි.** |
| **(ආ)** | **කුලී** | | |
| | **සමාලෝචිත වෂර්යේ දෙසැම්බර් 31 වැනි දින දක්වා ලංසු කැඳවීම මත බදු දීමෙන් ලැබිය යුතු මුළු මුදල රු. 14,014,830 ක් විය. ඉන් රු. 12,179,493ක් වසර 10කට වඩා පැරණි හිඟ ශේෂයක් පැවතුණි.** | **ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.** | **පැරණි හිඟ ශේෂයන් අයකිරීමට පියවර ගත යුතුයි.** |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වසරේ සහ ඊට පෙර වර්ෂයේ විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු රු.5,497,455ක් වීදි ලාම්පු හිඟ විදුලි බිල්පත් ගෙවා නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට වීදි ලාම්පු හිඟ විදුලි බිල්පත් අදියර වශයෙන් ගෙවනු ලැබේ. | හිඟ මුදල් ගෙවීම කඩිනම් කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1980 අංක 46 දරන සේවක අර්ථසාධක අරමුදල (EPF) පනතේ 16 වන වගන්තියට අනුව, සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් ප්‍රමාදය නිසා දඩ මුදල් ලෙස රු. 1,915,306 ක් ගෙවීමට සිදු වී තිබුණි | මෙම ගාස්තුව අදාළ පුද්ගලයන්ගෙන් අයකිරීමට කටයුතු කරනු ලැබේ. | නියමිත වේලාවට ගාස්තු ගෙවීම සිදු කළ යුතුය. |

## 3.2 අත්හැර දැමූ කතර්වයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ දී සභා පරිශ්‍රයේ ඉදිකරන ලද වාහන නැවතුම් මඩුව රු. 1,531,44ක කොන්ත්‍රාත්තුවක් ලබා දී රු.743,637ක් ගෙවීමෙන් පසු අතහැර දමා තිබුණි. | රටේ ඇති වූ අසාමාන්‍ය තත්ත්වය නිසා සභාවට ප්‍රමාණවත් ආදායමක් නොමැතිකම නිසාත් මේ තත්ත්වය ඇතිවිය. | අදාළ අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

**3.3** වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 වසරේදී රු. 24,444,588 ක වියදමින් ඉදිකරන ලද පොදු වෙළෙඳ පොළ ගොඩනැගිලි සංකීර්ණය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | LDSP මගින් ඉදිරියේදී සහල් මෝල්ක් බවට පත් කිරීමට පියවර ගනු ලැබේ. | ගොඩනැගිල්ල භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මහජන පුස්තකාලවල විද්‍යුත් පද්ධතිය හරහා සේවා සැපයීම සඳහා මිල දී ගත් රු. 1,992,850 වටිනා විද්‍යුත් උපකරණ අදාළ අරමුණුවලට භාවිතා කර නොතිබුණි. | ඉදිරියේදී පුහුණු නිළධාරියෙක් පත් කර කටයුතු කරනු ලැබේ. | නිශ්චිත අරමුණට සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

**3.4** මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් නිලධාරීන් 03 දෙනෙකුට ලබාදුන් ආපදා ණය, උත්සව අත්තිකාරම් රු. 572,802ක් වසර 05කට වැඩි කාලයක් ඔවුන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේවා ලියාහැරීම සම්බන්ධයෙන් AMC සාකච්ඡාවට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතයි. | ණය අත්තිකාරම් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පරිවාස කාලය අවසන් කළ නිලධාරීන් 03 දෙනෙකුගේ තනතුරු ස්ථිර කිරීමට අවශ්‍ය ලිපි ලේඛන විභාග දෙපාර්තමේන්තුවට යැවීමට සභාව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නැත | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුයි. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 තිරසාර සංවධර්න ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත අනුව තිරසාර සංවර්ධන අරමුණු වෙනුවෙන් සැලැස්මක් සකස් කර නොතිබුණි. | මේ වන විට තිරසාර සංවර්ධනයේ අරමුණු ළඟාකරගැනී සඳහා මූල්‍ය ප්‍රතිපාදන සම්බන්ධයෙන් සභාව කටයුතු කරමින් සිටී. | අදාළ ඉලක්කය සපුරා ගැනීම සඳහා සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |